# අයදුම්පත් කැඳවීම.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ/ශිෂ්‍ය සුභසාධක (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) තනතුර

## ඉංජිනේරු පීඨය

2026 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයෙන් පරිබාහිරව පිහිටි ඉංජිනේරු පීඨයට ඉහත සඳහන් අර්ධ කාලීන තනතුර සඳහා පත්කිරීමට සුදුස්සන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි කාලසීමාව 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා වලංගු වේ. මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරාලන ආචාර්ය මණ්ඩල සාමාජිකයාට උපරිම වසර 03 ක කාලයකට යටත්ව පමණක් සේවය කළ හැකි බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ඉන් ඉහල තනතුරුවල සේවය කරන ඉංජිනේරු පීඨයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් මේ සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

මෙම තනතුරෙහි රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් කිසිදු දීමනාවක් නොගෙවනු ලබන අතර රාජකාරී කටයුතුවලට අවශ්‍ය වෙනත් යම් පහසුකම් වෙතොත් ඒවා විශ්වවිද්‍යාලය මඟින් සපයනු ලැබේ.

තමා විසින්ම සකසා ගත් ජීවදත්ත තොරතුරු සහිත අයදුම්පතක් 2025.12.10 දිනට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී / ශිෂ්‍ය සුභසාධක වෙත ලැබීමට සලස්වන ලෙස තවදුරටත් කරුණාවෙන් දන්වමි.

M M Pathmal

උපකුලපති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

2025.11.10